# 한국어

(හන්ගුගෝ) කොරියානු භාෂාව

## 한글 කොරියානු හෝඩිය

කොරියානු හෝඩිය හන්ගල් ලෙස හඳුන්වයි. 1443 දී කොරියානු සේජෝන් රජතුමා විසින් නිර්මාණය කරන ලදී. ඒ වනතුරු කොරියානුවන් චීන රූපාක්ෂර වර්ගයක් වන හංජා අක්ෂර භාවිතා කරන ලදී. එම හංජා අක්ෂරවල ලිවීමේ කියවීමේ දුෂ්කරතා නිසා හන්ගල් හෝඩිය ඔහු විසින් නිර්මාණය කරන ලදී. එහි මුළු අකුරු සංඛ්‍යාව 40 කි. එය

- ස්වර 21
- ව්‍යංජන 19

ක් ලෙස ආකාර දෙකකට වෙන්වේ.

## 모음 ස්වර

කොරියානු හෝඩියේ ස්වර අක්ෂර විසිඑකක් ඇත. එය කොටස් දෙකකට බෙදයි.

01. ස්වර 10යි

02. **සංයුක්ත ස්වර 11යි**

## ස්වර

아 - ආ 야 - යා 어 - ඔ 여 - යො 오 - ඕ

요 - යෝ 우 - උ 유 - යූ 으 - අ 이 - ඉ

ස්වර අකුරු අනිවාර්යෙන්ම බිංදුව සමග ලිවිය යුතුය.

බිංදුව ස්වර අකුරට වම් පසින් හෝ ඉහළින් එකතු වේ.

## සංයුක්ත ස්වර

SMART LIFE TEAM - LAKMAL SANDARUWAN

## 애- එ 얘- යෙ 에- ඒ 예- යේ 와- වා

## 왜- වෙ 외- වෙ,워- වො 웨- වේ 위- වි

## 의- අයි

සංයුක්ත ස්වර 11 නිර්මාණය වී ඇත්තේ කෙටි ස්වර දෙකක් හෝ තුනක් එකතු වීමෙනි.

ㅐ - ㅏ+ㅣ = ㅐ

ㅒ - ㅑ+ㅣ = ㅒ

ㅔ - ㅓ+ㅣ = ㅔ

ㅖ - ㅕ+ㅣ = ㅖ

ㅘ-ㅗ+ㅏ = ㅘ

ㅙ-ㅗ+ㅏ+ㅣ = ㅙ

ㅚ-ㅗ+ㅣ = ㅚ

ㅝ-ㅜ+ㅓ = ㅝ

ㅞ-ㅜ+ㅓ+ㅣ = ㅞ

ㅟ-ㅜ+ㅣ = ㅟ

ㅢ-ㅡ+ㅣ = ㅢ

### 자음 ව්‍යංජන

ව්‍යංජන ගනන 19කි. එය කොටස් දෙකකට බෙදිය හැකිය. එනම්

01. **ව්‍යංජන 14යි**

02. **ද්විත්ව ව්‍යංජන 05යි**

SMART LIFE TEAM _ LAKMAL SANDARUWAN

ව්‍යංජන

ㄱ - ක/ග

ㄴ - න

ㄷ - ත/ද

ㄹ - ල/ර

ㅁ - ම

ㅂ - ප/බ

ㅅ - ස

ㅇ - o

ㅈ - ච/ජ

ㅎ - හ

ㅋ - ඛ

ㅌ - ථ

ㅍ - ඵ

ㅊ - ඡ

ද්විත්ව ව්‍යංජන

ㄲ - ක්ක

ㄸ - ත්ත

ㅃ - ප්ප

ㅆ - ස්ස

ㅉ - ච්ච

SMART LIFE TEAM _ LAKMAL SANDARUWAN

පිල්ලම් භාවිතය

සිංහල භාෂාවේ පිල්ලම් යනුවෙන් වෙනම සංකේත තිබුනත් කොරියානු භාෂාවේ එලෙස වෙනම සංකේත නොමැත.

කොරියානුවන් ස්වර 21 හි බිංදුව සංකේතය ඉවත් කොට පිල්ලම් ලෙස භාවිතා කරයි.

පිල්ලම් එකතු වනුයේ ව්‍යංජන අකුරු වලටයි. එහිදී සිදුවනුයේ ස්වර අකුරෙහි ඇති බින්දුව ඉවත් කොට එම බින්දුව තිබූ ස්ථානයට අදාළ ව්‍යංජන අකුර එකතු කිරීමයි. එලෙස සෑම ව්‍යංජන අකුරකටම පිල්ලම් ශබ්ද විසි එකක් නිර්මාණය කරගත හැක.

**ㄱ + 이 = 기**

**ක් + ඉ = කි**

## <u>받침 හල් කිරීම</u>

කොරියානු භාෂාවේ හල් කිරීම් වර්ග 7කි. ව්‍යංජන අකුරු දහනවයෙන් ㄸ - **ත්ත**, ㅃ - **ප්ප**, ㅉ - **ච්ච**, තුන අත් හැර අනෙක් ව්‍යංජන දාසය හල් කිරීම ලෙස භාවිතා කරයි.

ㄴ - **න්**
ㅁ - **ම්**
ㅇ - **ං**
ㄹ - **ල්**
ㅂ, ㅍ - **ප්**
ㄱ, ㅋ, ㄲ - **ක්**
ㄷ, ㅌ, ㅅ, ㅆ, ㅈ, ㅊ, ㅎ - **ත්**

කොරියානු භාෂාවේ හල් කිරීම යෙදෙනුයේ අක්ෂරයකට යටින් වේ.

උදාහරණ :
안 අන්
방 පං
악, 앜, 앆 අක්
말 මල්

SMART LIFE TEAM _ LAKMAL SANDARUWAN

밥 පප්
남 නම්
받, 밭, 밧, 밨, 밪, 밫, 방 පත්

SMART LIFE TEAM - LAKMAL SANDARUWAN